# පරිසර අමාත්‍යාංශය

## ජාතික ඕසෝන් ඒකකය

## ශීතකාරක එක්රැස් කිරීමේ සහ ප්‍රතිචක්‍රියකරණ වැඩසටහන

# දැන්වීමයි

## ශීතකාරක එක්රැස් කිරීමේ සහ ප්‍රතිචක්‍රියකරණය කිරීමේ උපකරණ ප්‍රදානය කිරීම

පරිසර අමාත්‍යාංශයේ ජාතික ඕසෝන් ඒකකය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා එක්ව ක්‍රියාත්මක කරන ජාතික අනුකූලතා කාර්යය සැලැස්ම යටතේ ක්‍රියාත්මක කරන ශීතකාරක එක්රැස් කිරීමේ සහ ප්‍රතිචක්‍රියකරණ වැඩසටහන යටතේ දිවයිනේ බොහෝ ප්‍රදේශ වල පිහිටි තෝරාගත් කාර්මික විද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන සහ ශීතකරණ සහ වායුසමන උපකරණ අළුත්වැඩියා කරන සේවා ස්ථාන වෙත ශීතකාරක එක්රැස් කිරීමේ සහ ප්‍රතිචක්‍රියකරණය කිරීමේ උපකරණ නොමිළයේ ප්‍රදානය කර ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වනුයේ නොඉදුල් CFC/HCFC සඳහා ඇති ඉල්ලුම අඩු කිරීමත් රට තුළ ඇති CFC/HCFC ප්‍රතිචක්‍රියකරණය කර නැවත භාවිතා කිරීම සඳහා ශීතකරණ සහ වායුසමන උපකරණ අළුත්වැඩියා කරන සේවා ස්ථාන හිමිකරුවන් සහ මහජනතාව උනන්දු කිරීමත්ය. එහෙත් යාපනය, මන්නාරම, කිලිනොච්චිය, මුලතිව්, වව්නියාව සහ ත්‍රිකුණාමලය ආදි දිස්ත්‍රික්ක වල පැවති ගැටුම්කාරී තත්වය හේතුවෙන් එම ප්‍රදේශ වල මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවස්ථාව නොලැබුනි.

ශීතකාරක එක්රැස් කිරීමේ සහ ප්‍රතිචක්‍රියකරණ කිරීමේ උපකරණ කට්ටල කිහිපයක් නුදුරු අනාගතයේදී ලැබීමට නියමිත බැවින් උක්ත දිස්ත්‍රික්ක වල පිහිටි ශීතකරණ සහ වායුසමන උපකරණ අළුත්වැඩියා කරන සේවා ස්ථාන වලට සහ ශීතකරණ සහ වායුසමන පාඨමාලා පවත්වාගෙන යන කාර්මික විද්‍යාල වලට ප්‍රමුඛත්වය දෙමින් මෙම උපකරණ බෙදා දීමට අපේක්ෂා කෙරේ. ඒ සඳහා එවැනි ආයතන වලින් අයදුම්පත් කැඳවනු ලැබේ. ඉදිරියේදී මෙම ප්‍රදේශ වල ශීතකරණ සහ වායුසමන උපකරණ අළුත්වැඩියා කරන සේවා ස්ථාන ඇරඹීමට බලාපොරොත්තු වන ආයතන වලටද මේ සඳහා අයදුම් කළ හැකි අතර ඔවුන් එම සේවා ස්ථාන ආරම්භ කිරීමට බලාපොරොත්තු වන දිනය සහ ස්ථානය පැහැදිලිව සඳහන් කළ යුතුය. නිසි තාක්ෂණික ඇගයීමකින් පසු තෝරා ගන්නා ලද ආයතන වලට මෙම උපකරණ ප්‍රදානය කරනු ලැබේ.

උතුරු නැගෙනහිර පළාත් වල ප්‍රමාණවත් තරම් සුදුසු අයදුම්කරුවන් නොසිටි නම් සෙසු දිස්ත්‍රික්ක වලින් තෝරාගත් අයදුම්කරුවන් සඳහා උපකරණ ප්‍රදානය කිරීමට බලාපොරොත්තු වේ. එබැවින් දිවයිනේ අනෙකුත් දිස්ත්‍රික්ක වලින්ද අයදුම්පත් කැඳවනු ලබන අතර මීට පෙර අවස්ථාවන්හිදී එවන ලද අයදුම්පත් නැවත සලකා නොබලන බවත් මෙම උපකරණ ලබා ගැනීමට බලාපොරොත්තු වන ආයතන සිටී නම් නැවත ඉල්ලුම් කළ යුතු බවත් කරුණාවෙන් සලකන්න.

මීට අදාල ආදර්ශ අයදුම්පත්‍රය ජාතික ඕසෝන් ඒකකයෙන් ලිපියක් මඟින් ඉල්ලුම් කිරීමෙන් හෝ ජාතික ඕසෝන් ඒකකයේ වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැක.

ඔබගේ අයදුම්පත්‍ර **2011 ජුලි මස 25** වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට යොමුකරන්න.


අධ්‍යක්ෂ,<br>
ජාතික ඕසෝන් ඒකකය,<br>
පරිසර අමාත්‍යාංශය,<br>
නො. 980/4, වික්‍රමසිංහ පෙදෙස, ඇතුල්කෝට්ටේ,<br>
කෝට්ටේ.

ටෙලි/ෆැක්ස් : 011-2883417 ඊ මේල් : ozone@noulanka.lk වෙබ් : www.noulanka.lk

ලේකම්,<br>
පරිසර අමාත්‍යාංශය,<br>
"සම්පත්පාය"<br>
බත්තරමුල්ල.